නේෂන්ස් ට්‍රස්ට් බැංකුව

# පුද්ගලික බැංකුකරණය

හිතවත් පුද්ගලික බැංකුකරණයේ ගනුදෙනුභවතුනි,

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද පාරිභෝගික ප්‍රඥප්තිය යටතේ වූ අවශ්‍යතාවයකට අනුව ප්‍රධාන කරුණු අන්තර්ගත ලේඛන මාලාවක් අප විසින් පිළියෙළ කර ඇති අතර මෙය අප විසින් පිරිනමනු ලබන බැංකු නිෂ්පාදන/සේවා වලින් ඔබට වඩාත් සුදුසු හා අවශ්‍යම දෑ තෝරා ගැනීමට අත්වැලක් වනු ඇත.

මෙම ප්‍රධාන කරුණු අන්තර්ගත ලේඛන මාලාව මඟින් පුද්ගලික බැංකුකරණය සඳහා නේෂන්ස් ට්‍රස්ට් බැංකුවෙන් ඔබට ලබා ගත හැකි යෝජිත සේවාවන් පිළිබඳ පුළුල් විස්තරයක් ලබා දේ.

කෙසේ වෙතත්, පහත සඳහන් ප්‍රධාන කරුණු අන්තර්ගත ලේඛනවල ප්‍රකාශිත තොරතුරු, නෛතික සහ රෙගුලාසිවල වෙනස්කම් සහ බැංකුවේ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටිවල වෙනස්කම් අනුව සංශෝධනය විය හැකි බව කරුණාවෙන් සලකන්න.

ඔබට වැඩිදුර තොරතුරු දැන ගැනීමට අවශ්‍ය නම් www.nationstrust.com යන වෙබ් අඩවියෙන් හෝ පැය 24පුරා ක්‍රියාත්මක + 94 (0) 114 626 262 දුරකතන අංකය හරහා අප හා සම්බන්ධ වන්න.

දක්වා ඇති කිසියම් ප්‍රතිලාභයක් සම්බන්ධයෙන් ඔබට යම් හෝ පැමිණිල්ලක් ඇත්නම්, කරුණාකර පැමිණිල්ල දැනුම් දීම සඳහා කෙටි ලිඛිත ප්‍රකාශයක් customerservice@nationstrust.com යන විද්‍යුත් ලිපිනයට හෝ [+94(0)11 4711411] දුරකථනයට යොමු කරන්න. අපි හැකි විගස ඔබට ප්‍රතිචාර දක්වන්නෙමු.

| ගිණුමේ විස්තරය | පාරිභෝගිකයින්ට ලැබෙන ප්‍රතිලාභ | ගාස්තු වර්ග හා අනෙකුත් බැංකු අයකිරීම් | ගිණුමක් විවෘත කිරීමේදී අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටිය | ප්‍රධාන කරුණු හා කොන්දේසි |
|---|---|---|---|---|
| **පුද්ගලික බැංකු සාමාජිකත්වය** සබැඳියාව මත පදනම් වූ මෙම පැකේජය, මෙහි විස්තර කර ඇති අයුරින්, ඉහළම මට්ටමේ පුද්ගල කේන්ද්‍රීය සේවයක් හා වටිනාකමක් සහිතව විශේෂිත බැංකු ආයෝජන හා අනෙකුත් මූල්‍ය වරප්‍රසාද රාශියක් ලබා දෙන පැකේජයකි. | • වත්කම් සැලසුම් සේවා[01]<br>• කලා උපදේශක සේවා[02]<br>• සුඛෝපභෝගී බෝට්ටු/ පුද්ගලික ජල යාත්‍රා (PWC) හා සාමාජිකත්වය[03]<br>• සංචාරක සහයක වරප්‍රසාද[04]<br>• නොමිලේ ගුවන්තොටුපල විවේකාගාර පහසුකම් (Palm Strip Lounge)[05]<br>• ධන හවුල්කාර සේවය[06]<br>• NTB පුද්ගලික බැංකුකරණයේ කණිෂ්ඨ සේවා අංශය හා අනාගත නායක වැඩසටහන<br>• පරාර්ථකාමී කළමනාකරණ ගිණුම් සේවය (PMAS)<br>• තැන්පතු හා ණය/අයිරා (ඇප සහිත) සඳහා මනාප පොලි අනුපාතිකය<br>• වෙළඳ නාමය සහිත චෙක්පොත් නොමිලේ | • නියමිත බැංකු ශේෂය පවත්වා ගෙන යාමට අපොහොසත් වන්නේ නම් රුපියල් 2500ක සේවා ගාස්තුවක් අයකරනු ලැබේ.<br>• ජංගම හා ඉතිරි කිරීම් (රුපියල්) ගිණුම්වල නියමිත මාසික සාමාන්‍ය ශේෂය පවත්වා ගෙන යාමට අපොහොසත් වන්නේ නම් අවම ශේෂ සේවා ගාස්තුවක් අයකරනු ලැබේ.<br>• පෙර තිරයේ ප්‍රතිලාභ හා සම්බන්ධ විශේෂ තත්වයන්ට යටත්ව බැංකුවේ සාමාන්‍ය ගාස්තු හා අය කිරීම් අදාළ වේ. | • පුද්ගලික බැංකු ගිණුමක් ආරම්භ කිරීම සඳහා නිසි ලෙස සම්පූර්ණ කරන ලද පෝරමය<br>• ජාතික හැඳුනුම්පතේ /වලංගු විදේශ ගුවන් ගමන් බලපත්‍රයේ පිටපතක්<br>• පදිංචි ලිපිනය ජාතික හැඳුනුම්පතේ/වලංගු විදේශ ගුවන් ගමන් බලපත්‍රයේ සඳහන් ලිපිනය හා වෙනස් වන්නේ නම් එය සනාථ කිරීම සඳහා ලිඛිත සාක්ෂි අවශ්‍ය වේ.<br>• පුද්ගලික බැංකු සාමාජිකත්ව ගිවිසුම් පෝරමය හා බැංකුවට අවශ්‍ය වෙනත් ලේඛන | ආයෝජන සැලසුම් හැර ඉතිරි කිරීම් හෝ ජංගම(රුපියල්) ගිණුම්වල **මාසික සාමාන්‍ය ණය ශේෂය රුපියල් 10,000ක්** ලෙස පවත්වාගෙන යාම<br>**හා**<br>වත්කම් හා වගකීම්වල සම්පූර්ණ සම්බන්ධතාව **මිලියන 20ක්** වීම<br>හෝ<br>වගකීම් සම්බන්ධතාව **මිලියන 10ක්** වීම<br>හෝ<br>නේෂන්ස් සැලරි සේවර්, ඉතිරි කිරීම් හෝ ජංගම් ගිණුමට **රුපියල්** 500,000ක මාසික ශුද්ධ වැටුපක් ප්‍රේෂණය කිරීම *(වැටුප් නිර්ණායක පුද්ගලික බැංකු ගෝලීය සේවාදායකයින්ට / ශ්‍රී ලංකාවේ වාසය නොකරන අයට අදාළ නොවේ)*<br><br>• අඛණ්ඩව මාස 6ක් තුල ශේෂය පහත වැටුණහොත්, බැංකුවේ අභිමතය පරිදි සියලුම විශේෂ වරප්‍රසාදයන් ඉවත් කර, |

| | | | | |
|---|---|---|---|---|
| | • මුදල් ආපසු ගැනීමට හා ශේෂය පිරික්සීමට ගාස්තු අය කිරීමකින් තොරව, අනෙකුත් තෝරා ගත් බැංකුවල ATM භාවිතය<br>• ඉහළ දෛනික මුදල් ආපසු ගැනීමේ සීමාවන්<br>• විදේශ මුදල් නිකුත් කිරීම්, මිලදී ගැනීම්, ගෙවීම් අණකර, ආරක්ෂිත තැන්පතු සේප්පු සඳහා විශේෂ තීරුබදු<br>• පූර්ව අනුමත Sri Lankan Airlines Platinum American Express® කාඩ්පතක් හෝ American Express Gold කාඩ්පතක්<br><br>පුද්ගලික බැංකු සේවයේ ගෝලීය සමාජිකත්ව සේවාදායකයින්ට ලබාගත හැකි ප්‍රතිලාභ<br><br>• දේශීය හා ජාත්‍යන්තර සෞඛ්‍යාරක්ෂණ සහාය[07]<br>• රියදුරෙකු ඇතිව හෝ නැතිව මෝටර් රථ කුලී සේවාව[08] | | | ගනුදෙනුකරුගේ වර්ගීකරණය Inner Circle සමාජිකත්වයට හෝ සාමාන්‍ය බැංකු ගනුදෙනුකරුවෙකු වශයෙන් අවස්ථානුකූලව වෙනස් කර හැක.<br><br>• ජංගම ගිණුමක් හෝ ඉතිරි කිරීමේ ගිණුමක් පවත්වා ගෙන යාම අනිවාර්යය වේ. |

**අදාළ කොන්දේසි**

01 - බාහිර වෘත්තීය නීති සමාගමක් විසින් 'වත්කම් සැලසුම්' සේවා පහසුකම සපයනු ලැබේ. එවැනි සේවාවන් සපයන්නෙකු වශයෙන් බැංකුව ක්‍රියා නොකරන අතර බැංකුව හුදෙක් ගනුදෙනුකරුව වෘත්තීය නීති සමාගමකට/සේවා සපයන සමාගමකට හඳුන්වාදෙන්නෙකු වශයෙන් පමණක් ක්‍රියා කරයි. එබැවින්, මෙම සේවාව යටතේ ගනුදෙනුකරුට ලබා දෙන උපදෙස් සහ සහායෝගය සම්බන්ධයෙන් බැංකුව කිසිදු වගකීමක් හෝ බැඳීමක් බාර නොගන්නා බව ගනුදෙනුකරු පිළිගත යුතුය.

02 - බාහිර සමාගමක් විසින් කලා උපදේශක සේවා පහසුකම සපයනු ලැබේ. එවැනි සේවාවන් සපයන්නෙකු වශයෙන් බැංකුව ක්‍රියා නොකරන අතර බැංකුව හුදෙක් ගනුදෙනුකරුව වෘත්තීය කලා උපදේශක සමාගමකට/සේවා සපයන සමාගමකට හඳුන්වාදෙන්නෙකු වශයෙන් පමණක් ක්‍රියා කරයි. එබැවින්, මෙම සේවාව යටතේ ගනුදෙනුකරුට ලබා දෙන උපදෙස් සහ සහයෝගය සම්බන්ධයෙන් බැංකුව කිසිදු වගකීමක් හෝ බැඳීමක් බාර නොගන්නා බව ගනුදෙනුකරු පිළිගත යුතුය.

03 - සුඛෝපබෝගී බෝට්ටු/පුද්ගලික ජල යාත්‍රා (PWC) වලට ප්‍රවේශය හා සාමාජිකත්වය බාහිර සමාගමක් විසින් සපයනු ලැබේ. එවැනි නිෂ්පාදන/සේවාවන් සපයන්නෙකු වශයෙන් බැංකුව ක්‍රියා නොකරන අතර හුදෙක් එවැනි නිෂ්පාදන/සේවාවන් සපයන සමාගමකට හඳුන්වාදෙන්නෙකු වශයෙන් පමණක් ක්‍රියා කරයි. ඒ සම්බන්ධයෙන් කිසිදු වගකීමක් බැංකුව දරනු නොලැබේ. මෙම විශේෂාංගය යටතේ පිරිනමනු ලබන ප්‍රතිලාභ වාර්ෂිකව සමාලෝචනය කෙරේ.

04 - සංචාරක සහායක වරප්‍රසාද බාහිර සමාගමක් විසින් සපයනු ලැබේ. එවැනි සේවාවන් සපයන්නෙකු වශයෙන් බැංකුව ක්‍රියා නොකරන අතර හුදෙක් එවැනි සේවාවන් සපයන සමාගමකට ගනුදෙනුකරුව හඳුන්වාදෙන්නෙකු වශයෙන් පමණක් ක්‍රියා කරයි. ඒ සම්බන්ධයෙන් කිසිදු වගකීමක් බැංකුව දරනු නොලැබේ. මෙම විශේෂාංගය යටතේ පිරිනමනු ලබන ප්‍රතිලාභ වාර්ෂිකව සමාලෝචනය කෙරේ.

05 - ශ්‍රී ලංකාවේ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ 'නොමිලේ ගුවන්තොටුපල විවේකාගාර පහසුකම් (Palm Strip Lounge)' යටතේ ලබාදෙන සේවාවන් සම්බන්ධයෙන් සැපයුම්කරුවෙකු වශයෙන් බැංකුව ක්‍රියා නොකරයි. බැංකුව හුදෙක් එවැනි සේවාවන් වලට ගනුදෙනුකරුව හඳුන්වාදෙන්නෙකු වශයෙන් පමණක් ක්‍රියා කරන අතර ඒ සම්බන්ධයෙන් කිසිදු වගකීමක් දරනු නොලැබේ. මෙම විශේෂාංගය යටතේ පිරිනමනු ලබන ප්‍රතිලාභ වාර්ෂිකව සමාලෝචනය කෙරේ.

06 - බැංකුව විසින් සපයනු ලබන ධන හවුල්කාර සේවාව තුලින් වර්තමාන සහ අනාගත මූල්‍ය අවශ්‍යතා සඳහා සූදානම් වීමට පුහුණු වෘත්තිකයකු විසින් ලබා දෙනු ලබන තොරතුරු සහ මඟපෙන්වීම යටතේ ගනුදෙනුකරු ආයෝජන කළඹක් ගොඩනගති. ආයෝජන කළඹේ සියලුම වත්කම් වෙන් කිරීම මෙන්ම තනි ආයෝජන අවස්ථා තෝරා ගැනීම ගනුදෙනුකරුගේ පූර්ණ අභිමතය පරිදි සිදු කෙරේ.

07- 'දේශීය හා ජාත්‍යන්තර සෞඛ්‍යාරක්ෂණ සහාය' ක්ෂේත්‍රයේ නිපුණ බාහිර සංවිධාන මගින් සපයනු ලැබේ. බැංකුව හුදෙක් එවැනි සේවාවන් වලට ගනුදෙනුකරුව හඳුන්වාදෙන්නෙකු වශයෙන් පමණක් ක්‍රියා කරන අතර ඒ සම්බන්ධයෙන් කිසිදු වගකීමක් දරනු නොලැබේ. මෙම විශේෂාංගය යටතේ පිරිනමනු ලබන ප්‍රතිලාභ වාර්ෂිකව සමාලෝචනය කෙරේ.

08- ‘රියදුරෙකු ඇතිව හෝ නැතිව මෝටර් කාර් රථ කුලී සේවා’ සැපයීම, ක්ෂේත්‍රයේ නිපුණ බාහිර සංවිධානයක් විසින් සිදු කරනු ලැබේ. බැංකුව හුදෙක් එවැනි සේවාවන් වලට ගනුදෙනුකරුව හඳුන්වාදෙන්නෙකු වශයෙන් පමණක් ක්‍රියා කරන අතර ඒ සම්බන්ධයෙන් කිසිදු වගකීමක් දරනු නොලැබේ. මෙම විශේෂාංගය යටතේ පිරිනමනු ලබන ප්‍රතිලාභ වාර්ෂිකව සමාලෝචනය කෙරේ.

Nations Trust Bank PLC යනු ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අධීක්ෂණය කරනු ලබන ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී වාණිජ බැංකුවකි. ‘Business Today’ සඟරාවේ ශ්‍රේණිගත කිරීමට අනුව ශ්‍රී ලංකාවේ හොඳම ව්‍යාපාරික ආයතන 30 අතරට නේෂන්ස් ට්‍රස්ට් බැංකුව ඇතුළත් වන අතර, පුළුල් පරාසයක විහිදුණු ගනුදෙනුකරුවන් සඳහා මූල්‍ය නිෂ්පාදන සහ සේවා රැසක් ඉතා සාර්ථකව ලබා දීමට කටයුතු කරයි. එසේම එය ශ්‍රී ලංකාවේ ප්‍රථම ඩිජිටල් බැංකුව වන ‘FriMi’ බැංකුවේ නිර්මාතෘ වන අතර දිවයින පුරා පිහිටි බැංකු ශාඛා 96ක් ඔස්සේ තම මෙහෙයුම් කටයුතු සිදු කරයි. ස්ථාන 135ක් ආවරණය වන ATM ජාලයකින්, මුදල් තැන්පතු හා මුදල් ආපසු ගැනීමේ යන්ත්‍ර 46කින්, Lanka Pay ජාලය ඔස්සේ ATM යන්ත්‍ර 3,500කට වැඩි ප්‍රමාණයකින් ක්‍රියාත්මක වන, ශ්‍රී ලංකාවේ American Express කාඩ්පත් නිකුත් කිරීමේ බලය ඇති එකම අවසරලාභී ආයතනය ද වේ.

2021 මාර්තු 15 කලාපය

*මෙහි සිංහල සහ ඉංග්‍රීසි පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, ඉංග්‍රීසි පාඨය බලපැවැත්වේ.*